# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2345/38 – 2023 අගෝස්තු මස 15 වැනි අඟහරුවාදා – 2023.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47 (viii).

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති '' ශ්‍රී සද්ධර්ම යුක්තික වන සෙනසුන'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "ශ්‍රී සද්ධර්ම යුක්තික වන සෙනසුන" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට, විධානය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

1A – G 40132 – 16 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

*"ශ්‍රී සද්ධර්ම යුක්තික වන සෙනසුන" සංයුක්ත වන ප්‍රදේශය*

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 311, පුල්මුඩේ (අංක 1) ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, පුල්මුඩේ ග්‍රාමයේ පිහිටි ඉඩම් සඳහා සර්වේයර් ජනරාල්වරයාගේ 2019 සැප්තැම්බර් මස 09 වන දින දරන අංක එෆ්.වී.පී. 30 (FVP 30) දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1145, අලඩිප්පුලව් ඉඩම සහ තොන්ඩමුරිප්පු ඉඩම (හෙක්. 7.1466), කැබලි අංක 1146 අලඩිප්පුලව් ඉඩම සහ තොන්ඩමුරිප්පු ඉඩම (හෙක්ටයාර 4.3715), කැබලි අංක 1147 අලඩිප්පුලව් ඉඩම (හෙක්. 11.7193), කැබලි අංක 1148 අලඩිප්පුලව් ඉඩම (හෙක්. 7.4712) කැබලි අංක 1153 නවලඩි මොට්ටායි ඉඩම (හෙක්. 1.0438) නැමැති ඉඩම් වලින් සමන්විත හෙක්ටයාර 31.7524 ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය:

**කැබලි අංක 1145 - අලඩිප්පුලව් ඉඩම සහ තොන්ඩමුරිප්පු ඉඩම**

*උතුරට* : කැබලි අංක 715, 711, 686, සහ 685;
*නැගෙනහිරට* : කැබලි අංක 686, 685 සහ 1149;
*දකුණට* : කැබලි අංක 1148 සහ 222;
*බටහිරට* : කැබලි අංක 222, 224, 716 සහ 715.

**කැබලි අංක 1146 - අලඩිප්පුලව් ඉඩම සහ තොන්ඩමුරිප්පු ඉඩම**

*උතුරට* : කැබලි අංක 738, 740, සහ 222;
*නැගෙනහිරට* : කැබලි අංක 740, 222, සහ 1147;
*දකුණට* : කැබලි අංක 1147 සහ 736;
*බටහිරට* : කැබලි අංක 1147, 736, සහ 738.

**කැබලි අංක 1447 - අලඩිප්පුලව් ඉඩම**

*උතුරට* : කැබලි අංක 735, 736, 1146 සහ 222;
*නැගෙනහිරට* : කැබලි අංක 222 සහ 1151;
*දකුණට* : කැබලි අංක 1151 සහ 145;
*බටහිරට* : කැබලි අංක 1152, 735 සහ 736.

**කැබලි අංක 1448 - අලඩිප්පුලව් ඉඩම**

*උතුරට* : කැබලි අංක 1145 සහ 1149;
*නැගෙනහිරට* : කැබලි අංක 1149 සහ 1150;
*දකුණට* : කැබලි අංක 1150 සහ 222;
*බටහිරට* : කැබලි අංක 222 සහ 1145.

**කැබලි අංක 1153 - නවලඩි මොට්ටායි ඉඩම**

*උතුරට* : කැබලි අංක 145;
*නැගෙනහිරට* : කැබලි අංක 1154;
*දකුණට* : කැබලි අංක 1155;
*බටහිරට* : කැබලි අංක 1155 සහ 145.

EOG 08 – 0159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.